**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 මතය**

---------

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා අග්‍රිම අවශ්‍යතාව ලෙස රු.235,135,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.171,825,664 ක් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ අග්‍රිමයෙන් රු.63,309,336 ක් අඩුවෙන් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී අග්‍රිම අධි ඇස්තමේන්තු කිරීමක් කර තිබුණි. එසේම 2021 දෙසැම්බර් මාසය සඳහා රු.19,685,000 ක් අග්‍රිම අවශ්‍යතාවය ලෙස සැලසුම් කර තිබූ නමුත් එම අවශ්‍යතාවය ඉක්මවා රු.22,404,222 ක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීම හා අග්‍රිම ඉල්ලුම් කිරීමේ කළමනාකරණය දුර්වල වී තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ නොවේ.<br><br>2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන වැය නොකර ඉතිරි කිරීමට පියවර ගැනීම හේතුවෙන් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ අග්‍රිම සැලසුම වෙනස් වීම. 2021 දෙසැම්බර් මාසයේදී මු.රෙ. 66 ප්‍රකාර ප්‍රතිපාදන මාරු කර ගැනීම නිසා හා PALAMA ව්‍යාපෘතිය යටතේ විදේශධාර වශයෙන් ලැබී තිබුණු ද්‍රව්‍යාධාර රේගුවෙන් නිදහස් කර ගැනීමට සිදු වීම නිසා දෙසැම්බර් මාසයේ සැලසුම් කළ අග්‍රිම ප්‍රමාණය ඉතිරිවීමක් සිදුවී තිබුණි. | සාර්ථක මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නිවැරදිව අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම**<br><br>වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.3,100,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ නොවේ. කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රතිපාදන වැය නොකර ඉතිරි කිරීමට පියවර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **අධි ප්‍රතිපාදන සලසා තිබීම**<br><br>සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 19 කට එකතුව රු.13,358,167,610 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.4,250,195,132 ක් වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන්ට සලසා තිබුණ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ නොවේ. 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ප්‍රතිපාදන අවුරා තබන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) යටතේ ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සියළුම බැඳීම් හෙළිදරව් කළ යුතු වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA – 92 අනුව එකතුව රු.354,082,475 ක් වූ බැඳීම් මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂය වෙනුවෙන් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පවතින බිල්පත් ගෙවීම් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව තුළ ප්‍රතිපාදන වෙන්කර දී නොමැති අතර, මෙම ගෙවීම් කිරීම සඳහා අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්ගේ වැය විෂය යටතේ වෙන්කර දී ඇති අතර, අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ වැය විෂයයන් යටතේ 2021.12.31 දිනට නොපිය වූ බිල්පත් ලෙස රු. 470,075,446 ක් වාර්තා කර ඇත. | භාණ්ඩාගාර පොත්වල සඳහන් බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බැවින් භාණ්ඩාගාර පොත් නිවැරදි කිරීම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සටහන් (iii) අනුව 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ, භාණ්ඩාගාරය විසින් එක් එක් වැය විෂයය වලට නිකුත් කරනු ලබන බැඳීම්, බැරකම් ප්‍රකාශය සමඟ සසඳා තිබිය යුතුය. භාණ්ඩාගාරයේ SA – 92 සමුච්චිත බැරකම් වාර්තාවේ එකතුව රු.776,593 ක් වූ බැරකම් | නිරීක්ෂණය කරන ලද කරුණ සමඟ එකඟ නොවේ.<br>මෙය දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ සිදුවීමකි. රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/2 හා 2021.10.26 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව 2021 වර්ෂයට අදාළව බැඳීම් හා බැරකම් සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කළ නමුත් | මු.රෙ.427 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ පොත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා එය නිවැරදි කළ යුතුවීම. |

| | |
|---|---|
| මූලාා ප්‍රකාශන වල සටහන් (iii) හි ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩාගාර SA -92 සමුච්චිත බැරකම් වාර්තාවේ සඳහන්ව නොමැතිවීම පිළිබඳව රාජා ගිණුම් දෙපාර්තමේන්තුවෙන් වාචිකව විමසීම් කරන ලද අතර, එය තාක්ෂණික දෝෂයක් හේතු කොටගෙන මෙම වාර්තාවේ සඳහන් වී නොමැති බව දන්වන ලදී. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 104(1)(අ) | දෙපාර්තමේන්තවේ වාහන 02 කට සිදුවී තිබුණු අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ප්‍රාරම්භක වාර්තා පිළිවෙලින් දින 28 කින් හා මාස 4 කින් ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක් අනතුරට ලක් වූ අතර එම අනතුරු සම්බන්ධ මු.රෙ යටතේ සිදු කරන ලද පරීක්ෂණ වාර්තා නිසි වේලාවට ඉදිරිපත් කිරීමට නොහැකි වූයේ රටේ පැවති COVID 19 වසංගත තත්ත්වය නිසා අඩු නිලධාරීන් පිරිසකගෙන් රාජකාරි ඉටුකිරීමට සිදුවීම හා රාජා පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරීන් ගෙන්වීම සීමා වීම හා නිලධාරින් කොටසකට රෝග වැළඳීම යන කරුණු නිසාය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 104 (4) ඡේදය | ඉහත සඳහන් වාහන අනතුරු සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත මු.රෙ. 104(4) ප්‍රකාර පූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතුව තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් එක් වාහනයක් සඳහා මාස 04 කට ආසන්න කාලයක් ප්‍රමාද කර | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | වාර්තාව ඉදිරිපත් කර තිබුණි. අනෙක් වාහනය සඳහා 2022 මැයි 18 දින වන විටත් මාස 14 ක කාලයක් ගත වී තිබුණත්, එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඈ) | මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | ඇප තැබීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | මුදල් රෙගුලාසි 1645(අ) | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | වාර සේවා, අලුත්වැඩියා, ටයර්, බැටරි පිළිබඳ ලොග් සටහන් පොත් යාවත්කාලීන කර ඇත. අනෙකුත් විස්තර යම් ප්‍රමාණයක් යාවත්කාලීන නොවී ඇති අතර එම විස්තර ඇතුළත් කර ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරියා විසින් මාසයකට පසු ඊලඟ මාසයේ 15 දිනට ප්‍රථම මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | සඳහන් කර ඇති නිරීක්ෂණ සමග එකඟ වන අතර ඉදිරියේදි දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | මුදල් රෙගුලාසි 1647 (ඉ) | සෑම රජයේ ආයතනයක්ම වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුව තිබුණත්, එවැනි ලේඛනයක් යාවත්කාලින කර පවත්වා නොතිබුණි. | වාහන ලේඛනයක් පවත්වා නොමැති අතර ඉදිරියට එවැනි ලේඛනයක් පවත්වාගෙන යාමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂාවක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. | ප්‍රධාන අලුත්වැඩියා කටයුතුවලින් පසුව ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂාවන් සිදු කර ඇත. අවසන් වරට වාහන දෙකක් වෙනුවෙන් පිළිවෙලින් 2019.09.04 දින හා 2021.06.09 දින ඉන්ධන දහන පරික්ෂාව සිදු කර ඇත. ඒ අනුව 25000 Km ධාවනය කිරීමෙන් අනතුරුව හෝ මාස 12 ක කාල සීමාවක් යන දෙකෙන් එළඹෙන පළමුව අවස්ථාව අනුව එම පරික්ෂාව සිදු කර නොමැති අතර මෙම වසර තුළ එම පරික්ෂාව සංචිත වාහන සඳහා සිදුකිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |
| (ඌ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදය | 2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.1,402,031 ක් වී තිබුණි. එම ශේෂය එදිනම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදයට පටහැනිව එම ශේෂය භාණ්ඩාගාරය නිරවුල් නොකළ ශේෂයක් ලෙස සලකා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | අතපසුවීමකින් ඉකුත් වර්ෂයේ පරිදි 2021 වර්ෂයේදීද මුදල් හා මුදල්වලට සමාන දෑ හි ශේෂයට ඇතුළත් කරන ලද අතර, නිවැරදි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නිවැරදි කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ යුතු විම. |
| (එ) | මුදල් රෙගුලාසි 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ආකෘති පත්‍රය භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, සම්පූර්ණ කළ එම ආකෘති ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. එම ආවරණ ලිපියේ, සමීක්ෂණ වාර්තාවේ සහ හා.හා.ග.ප.66 ආකෘති වල ඡායා පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුම සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතුව රු. 3,696 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 34(1) අනුව මූලධන වියදම් අයවැය ලේඛනයට ඇතුළත් කිරීම සඳහා නව ව්‍යාපෘති යෝජනා පිළිගනු ලබන්නේ සම්පත් ලබා ගැනීමට ඇති ඉඩකඩ අනුව රජය විසින් අනුමත කර ඇති ආයෝජන ප්‍රමුඛතාවයන් පදනම් කරගෙනය. නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අනුමත කරනු ලැබූ ඇත්තාවූද, රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කරනු ලැබ ඇත්තාවූද, ව්‍යාපෘති පමණක් මුදල් සැපයීම සඳහා පිළිගනු ලබයි. ඒ අනුව මධ්‍යකාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව 2021 – 2024 සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021 අයවැය අවසන් වීමෙන් පසුව පිළියෙල කර තිබූ අතර | 2017-2020 සහ 2021-2024 යන රාජ්‍ය ආයෝජන වැඩසටහන් මේ වනවිට මුද්‍රණය කොට ඇත.<br><br>රාජ්‍ය ආයෝජන වැඩසටහන ඉදිරි වර්ෂ තුනක කාලයක් සඳහා වන රාජ්‍ය ආයෝජන පදනම් කරගනිමින් සකස්වන අතර මෙහිදී පවතින වසර එහි පාදක වර්ෂය කොටගනු ලබයි. ඒ අනුව 2021-2024 රාජ්‍ය ආයෝජන වැඩසටහනේ 2021 යනු එහි පාදක වර්ෂය වේ. | පාදක වර්ෂයට අදාළ ආයෝජන සැලැස්ම අනුව අයවැය පිළියෙල කළ යුතු බැවින් ආයෝජන සැලැස්ම අයවැය අනුමැතියට පෙර ඉදිරිපත් කළ යුතු වීම. |

රාජ්‍ය ආයෝජන වැඩසටහන් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසයේදී රු.1,927,072 ක් වැය කර තිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් 2021 වර්ෂයේදී වෙනත් දෙපාර්තමේන්තු වෙත තාවකාලික පදනම මත මුදා හැර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම වාහන විධිමත් පරිදි භාරදීම හෝ ආපසු ලබා ගැනීම හෝ කටයුතු කර නොතිබුණි. | අංක WP CBH – 7437 දරන වාහනය 2022.01.27 දින නැවත මෙම දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.<br><br>අංක WP KP – 9601 දරන වාහනය දැනට තාවකාලිකව ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. | වත්කම් මුදා හැරීමේදී විධිමත් පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු වාහනයක් ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත තාවකාලික පදනම මත මුදා හැර තිබුණි. එම දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කරනු ලබන අවස්ථාවේදී 2021 මාර්තු 30 දින අනතුරකට ලක් වී තිබුණි. වාහන අනතුර සම්බන්ධව වරදකරු වූ තෙවන පාර්ශ්වික රක්ෂණ ආයතනය විසින් එම අළුත්වැඩියාව ඉටුකර තිබුණි. එම අළුත්වැඩියාව විධිමත් පරිදි ඉටුකර තිබුණු බව තාක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි. | අනතුරට පත් මෙම දෙපාර්තමේන්තුවට අයත් අංක WP CBH – 7445 හා WP CBH – 7448 දරන වාහන අනතුර සිදු වූ අවස්ථාවේදි අදාළ රක්ෂණ සමාගමේ නියෝජිතයෙකු විසින් අනතුර සිදු වූ ස්ථානයට පැමිණ මූලික පරික්ෂාව සිදු කළ අතර එම වාහනවල සේවා නියෝජිත ආයතනය වන Toyota Lanka (pvt) Ltd. විසින් අළුත්වැඩියා සිදු කර ඇති අතර, රක්ෂණ සමාගමේ වෘත්තීය දැනුම ඇති ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් විසින් අළුත්වැඩියාව පරික්ෂා කර ඇත. | අළුත්වැඩියා කටයුතු විධිමත් පරිදි සහතික කළ යුතු වීම |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2021 ජුනි 12 අනතුරකට ලක් වී තිබුණි. එය අළුත්වැඩියාව වෙනුවෙන් පෞද්ගලික ආයතනය විසින් රු.135,069 කට ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. රක්ෂණ සමාගමේ අනුමැතියට යටත්ව අළුත්වැඩියාව සිදු කිරීමට දෙපාර්තමේන්තුව මඟින් දන්වා | - එම - | අළුත්වැඩියා කටයුතු විධිමත් පරිදි සහතික කළ යුතු වීම |

තිබුණි. ඒ අනුව රු. 68,860 කට අළුත්වැඩියාව සිදුකරගෙන තිබුණි. එම අළුත්වැඩියාව විධිමත් පරිදි ඉටුකර තිබුණු බවට තාක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

**3.3 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 හා 2022 වර්ෂවල දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කළ යුතු වුවද, විගණනය දිනය වූ 2022 මැයි 12 දින වන විටත් 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පමණක් එහි ඇතුළත් කර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම ඇතුළත් කර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇත. | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතු විම. |
| (ආ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.242,354 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුමකට එළඹ තිබුණි.<br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව පිරිසිදු කිරීම පිළිබඳ වාර්තාවක් කොන්ත්‍රාත්කරු විසින් ලබාදිය යුතුව තිබුණත්, එසේ වාර්තාවක් ලබාගත් බව සනාථ කිරීමේ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව පිරිසිදු කිරීමේ වාර්තාවක් එම ආයතනය විසින් ලබා දී නොමැති අතර එය ලබා ගැනිමටද කටයුතු කිරීම සිදුවී නොමැත. | ගිවිසුම්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) ගිවිසුමේ සඳහන් පරිදි සේවයේ යොදවන සේවකයින් විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පැමිණීමේ ලේඛනයේ දිනපතා පැමිණීම හා පිටවීම සටහන් කළ යුතුව තිබුණත්, අදාළ ගෙවීම් කිරීමේදී පැමිණීම හා පිටවීම් ලේඛනය පරීක්ෂා කර නිවැරදි බවට වගකිව යුතු නිලධාරියෙකු විසින් සහතික කර තිබුණු බව සනාථ කෙරුන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිරිසිදු කිරීමේ සේවකයින් සඳහා පැමිණීමේ පිටවීමේ ලේඛනයක් පාලන අංශයේ පවත්වාගෙන යන අතර විෂය නිලධාරියා විසින් එය පරීක්ෂාකර ඉදිරිපත් කර ඇති බිල්පත ඒ අනුව සංශෝධනය කර ගෙවීමට කටයුතු කර ඇත. | ලේඛන විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වාගත යුතු විම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු කරා ලඟාකර ගැනීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාළ නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.<br><br>තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි. එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදාළව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු නොලැබේ. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරිම නිසා ලබාගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීමට හා ඒවා අත්කර ගැනිමට අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 118 ක් වූ අතර ඉන් තනතුරු 32 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු වූ තනතුරුවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් ද, තෘතියික මට්ටමේ තනතුරක්ද, ද්වීතීක මට්ටමේ තනතුරු 9 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 6 ක් ද විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අදාළ අවස්ථාවලදී මුදල් අමාත්‍යාංශය වෙත පුරප්පාඩු දැනුම් දීම හා දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලීම් සඳහා, මුදල් අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කිරීම සඳහා එකඟතාවය ලබා දීම සිදු කර ඇත. නමුත් නිලධාරීන් සියළු දෙනාම සඳහා ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත්ව නොමැතිවීම නිසා ඉඩකඩ පහසුකම් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් නිරන්තරයෙන්ම ඉල්ලීම් කළද ඉඩකඩ පහසුකම් නොලැබීම. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කාර්යමණ්ඩලය පත්කර ගත යුතු අතර අත්‍යාවශ්‍ය නොවන කාර්යමණ්ඩලය සිටීනම් එම අනුමත සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය වශයෙන් පත් කිරීමට නොපමාව කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර වර්ෂ 09 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | -එම- |